(17) (8) (142) (239)

වගා සහනාධාර චක්‍රලේඛ අංක : 65.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
2007 ක්වූ ජූනි මස 29 වැනි දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්.

කුඩා පරිමාණයේ කුඩා තේ ඉඩම් නැවත වගාව තුළින් සංවර්ධනය කිරීම.

චක්‍රලේඛ පරමාර්ථ:

(අ) අක්කර 1/2 දක්වා වූ කුඩා තේ ඉඩම් තෝරා ඉන් අක්කර ද 1/4 ඉඩම් ප්‍රමාණයන් නැවත වගාවට යොමු කර සංවර්ධනය කිරීම.

(ආ) නැවත වගාව සිදුකරන කාලය තුළදී අහිමිවන ආදායම සඳහා පරිතෝෂණ දීමනාවක් ලබාදීම තුළින් කුඩා පරිමාණයේ තේ ඉඩම් නැවත වගාවට යොමු කිරීම දිරිමත් කිරීම.

(ඇ) ජාතික වශයෙන් කුඩා පරිමාණයේ ඉඩම්වල නිෂ්පාදන ඵලදායිතාවය සමබරව පවත්වාගෙන යාම සඳහා ක්‍රියා කිරීම.

1. **හැඳින්වීම.**

තේ නැවත වගාකිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල වගා සහනාධාර චක්‍රලේඛ 64 මගින් වැඩිකර ඇති වුවද අක්කර 1/2 දක්වා වූ කුඩා පරිමාණයේ ඉඩම් හිමියන් නැවත වගාවේදී සිදුවන ආදායම් අහිමිවීමේ ගැටළුව මත නැවත වගාවට යොමු නොවේ. 2005 කුඩා තේ ඉඩම් සංගණනයට අනුව අක්කර 1/4 දක්වා වූ කුඩා තේ ඉඩම් 251892 ක් එනම් මුළු සංඛ්‍යාවෙන් 63.5% ක් හා එම අයත් බිම් ප්‍රමාණය අක්කර 79377 ක් එනම් මුළු බිම් ප්‍රමාණයෙන් 24.3% ක් පිහිටා ඇති බැවි වාර්තා වී තිබේ. කුඩා තේ වතු අංශය ගැන සළකා බැලීමේදී එම කොටස අධික වන අතර, ඒ ගැන නියි අවධානයක් යොමු නොකළහොත් ඉන් කුඩා තේ වතු අංශයට අනාගතයේදී අහිතකර බලපෑමක් ඇතිවීමට ඉඩ ප්‍රස්ථා අධික බැවි පෙනී යයි. එබැවින් එවැනි කුඩාම පරිමාණයේ (පර: 20 සිට අක්කර භාගය දක්වා වූ) ඉඩම් තෝරා නැවත වගාවට යොමු කර තේ නිෂ්පාදනය සමබරතාවයකින් පවත්වාගෙන යාමට අනුබලදීම හා ඔවුන්ගේද ආදායම් තත්ත්වය වර්ධනය කිරීම අපගේද වගකීමක්ව පවතී.

2. **සුදුසු ඉඩම් තේරීමේ ක්‍රියාවලිය:**

අක්කර භාගයක උපරිම ඉඩම් ප්‍රමාණයක් සහිත තේ නැවත වගාවට යොමු කිරීමේ අවශ්‍යතාවය ඇති ඉඩම්, අධිකාරිය සතුව පවතින සංගණන ලේඛණ හා ඉඩම් ලේඛණ අතුරින් තෝරා ගත යුතුය.

සමෘද්ධි ආධාර හෝ ගමනැගුම හෝ වෙනත් රාජ්‍ය ආයතනයකින් ආධාර ලබන ඉඩම් හිමියන්ගේ ඉඩම් මෙම කරුණ යටතේ සංවර්ධනය කිරීමට තෝරා නොගත යුතුය.

මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ පහසුව සඳහා ගම් හෝ ග්‍රාම නිලධාරී වසම් අනුව ඒකරාශිවූ ප්‍රදේශවල පිහිටි ඉඩම් වගාකරුවන් තෝරා ගැනීම වඩා පහසුවනු ඇත.

(142) /A

3. **තේ අක්කර 1/4 සඳහා වැය කළ හැකි මුදල.**

මෙම වැඩසටහන සඳහා තෝරාගනු ලබන කණ්ඩායම වෙත අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන නැවත වගා සහනාධාර මුදල් හිමි නොවන අතර,ඒ සඳහා වගා සහනාධාර වැඩ පිළිවෙළ අදාල කර නොගත යුතුය.

තෝරා ගනු ලබන ඉඩම් හිමියන් වෙත ඉඩමේ ප්‍රමාණයෙන් 50% ක් දක්වා අක්කර 1/4 ක උපරිමයකට යටත්ව පහත සඳහන් කරුණු යටතේ මුදල් ප්‍රතිපාදන සලසා දිය යුතුය.
අක්කර 1/4 සංවර්ධනය සඳහා වර්ෂ 02 කට ඇස්තමේන්තුව පහත පරිදි ය.

(i)	තෘණ දඬු හා ඒවා ප්‍රවාහනය කිරීම	-රු. 1000.00
(ii)	තෘණ නඩත්තුව සඳහා පොහොර	-රු. 1000.00
(iii)	තේ පැල සඳහා ද්‍රව්‍යමය යෙදවුම්	-රු. 3500.00
(iv)	වර්ෂ 02 සඳහා පොහොර	-රු. 2000.00
(v)	මාසයකට රු.750/- බැගින් මාස 24 සඳහා පරිභෝජන දීමනා.	- රු.18000.00
	අක්කර 1/4 සඳහා මුදල	-රු.25500.00
		=======

ඉහත පිරිවැය ඇස්තමේන්තුව අක්කර 1/4 ඉඩම් කැබැල්ලක් සඳහා වේ. තමන්ගේම ශ්‍රමය හෝ අත්තමේ ශ්‍රමය භාවිතා කරමින් ගොවීන් නියමිත කාලය තුළදී වගා කටයුතු සඳහා යොමුකරවීමට පෙළඹවිය යුතු වේ.

4. **පරීක්ෂණ සහ වාර්තා පවත්වාගෙන යාම .**

ඉහත වැඩසටහන සඳහාද අධිකාරියේ සාමාන්‍ය ආධාර ක්‍රමය යටතේ වන අවසර පත්‍ර නිකුත් කර ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකළ යුතුය.

5. **පස සාරවත් කිරීම සඳහා තෘණ සිටුවීම .**

ඉහත ව්‍යාපෘතිය සඳහා තෝරාගනු ලබන ඉඩම් පමණක් තෘණ සිටුවා පාංශු පුනරුත්ථාපනය කිරීම මාස 12 ක කාලයකට සිදුකොට තේ පැල සිටුවන අවස්ථාවේ කාණු/වලවල් සඳහා කොම්පෝස්ට් භාවිතා කිරීමේ ක්‍රමය අනුගමනය කිරීමට පෙළඹවිය යුතුය. මේ සඳහා කල් ඇතිව කොම්පෝස්ට් නිෂ්පාදනය කරගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබාදිය යුතුය. තෘණ සිටුවා අවසන් කිරීමෙන් පසුව මාසිකව රු.750/- බැගින් පරිභෝජන දීමනාව මාස 24 සඳහා කුඩා තේ වතු හිමියා/බලපත්‍රකරු වෙත ගෙවිය යුතුය.

6. **ක්‍රියාත්මක කිරීම හා ප්‍රගතිය.**

මෙම වැඩ සටහන 2007 වර්ෂය තුළදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉඩම් තෝරා ගැනීමට ක්‍රියාත්මක කළයුතු අතර, ප්‍රගතිය කාර්තුමය වශයෙන් වාර්තා කළයුතුය. ඒ සඳහා නියමිත ආකෘතියක් හඳුන්වාදීමට කටයුතු කරනු ඇත.

මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව ක්‍රියා කරන බවත් සනාථ කළ යුතුය. ඔබගේ සියලු කාර්ය මණ්ඩලය මේ පිළිබඳව දැනුවත් කළයුතු අතර, දැන්වීම් පුවරුවේ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමටද කටයුතු කරන්න.

(හොවල් පද්මසිරි කාරියවසම්)
සභාපති

පිටපත් :

1. සාමාන්‍යාධිකාරී.
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(සංවර්ධන/ව්‍යාප්ති)
3. සහකාර සාමාන්‍යාධිකාරී(සංවර්ධන)
4. අභ්‍යන්තර විගණක.
5. මුදල් කළමනාකරු
6. කෘෂි අර්ථශාස්ත්‍රඥ
7. සහකාර ප්‍රජා සංවර්ධන කළමනාකරු.
8. සියලුම මාණ්ඩලික නිලධාරීන්.
9. සියලුම ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
10. තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
11. ප්‍රාදේශීය සමිති සංවිධානවල ගරු සභාපති/ලේකම්වරුන්

ජ/6/19